# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## රියදුරු / කොන්දොස්තර තනතුරු සඳහා බඳවා ගැනීම

### *යහපත්, ගුණාත්මක ප්‍රවාහන සේවයක සාඩම්බර කොටස්කරුවෙකු වීම සඳහා අප හා එක්වන්න*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, දිවයින පුරා විසිරී පවතින ඩිපෝ 107 ක් හා ඊට සම්බන්ධිත ප්‍රාදේශීය වැඩපලවල්, රියදුරු පාසල් වලින් සමන්විත, 26,000 කට වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරන රාජ්‍ය මගී ප්‍රවාහන ආයතනයක් වන අප ආයතනයේ සියලුම ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝවන්හි පුරප්පාඩු පවතින රියදුරු හා කොන්දොස්තර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත පහත සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පුරප්පාඩු පවතින ප්‍රාදේශිකයන්**

| ප්‍රාදේශිකය | රියදුරු | කොන්දොස්තර |
|---|---|---|
| කොළඹ | 112 | 45 |
| කළුතර | 70 | 26 |
| ගම්පහ | 74 | 22 |
| වයඹ | 82 | 35 |
| සබරගමුව | 82 | 33 |
| මහනුවර | 80 | 30 |
| නුවරඑළිය | 46 | 25 |
| රුහුණ | 80 | 34 |
| රජරට | 90 | 35 |
| ඌව | 66 | 32 |
| උතුර | 64 | 34 |
| නැගෙනහිර | 66 | 30 |

**01. රියදුරු තනතුර (කොන්ත්‍රාත්)**

**අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

I. අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් 06 ක් සම්මාන සාමාර්ථ 02 ක් සමග සමත්වීම. (දෙවරකට නොවැඩි වාර ගණනකදී)
II. වයස අවුරුදු 18-45 අතරවීම
III. අවුරුදු 03 කට වැඩි වලංගු බරවාහන බලපත්‍රයක් සතුවීම
IV. අවම බර කි.ග්‍රෑ. 46 ක් වීම
V. උස අඩි 5 අඟල් 3
VI. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම
VII. පිළිගත් ආයතනයක බරවාහන (මගී ප්‍රවාහන විශේෂයි) රියදුරෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

**02. කොන්දොස්තර තනතුර (කොන්ත්‍රාත්)**

**අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

I. අ.පො.ස. (සා/පෙළ) විභාගය ගණිතය හා මව් භාෂාව ඇතුළුව විෂයයන් 06 ක් සම්මාන සාමාර්ථ 02 ක් සමග සමත්වීම. (දෙවරකට නොවැඩි වාර ගණනකදී)
II. වයස අවුරුදු 18-45 අතරවීම
III. අවම බර කි.ග්‍රෑ. 46 ක් වීම
IV. උස අඩි 5
V. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම
VI. කොන්දොස්තර මගී ප්‍රවාහන බලපත්‍රයක් සතුවීම විශේෂ සුදුසුකමකි.

**පොදු කොන්දේසි හා ලබාදෙනු ලබන පහසුකම්**

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% වන අතර, සේව්‍යයා විසින් 12% ක්ද දායකත්වය දරනු ඇත. සේවක භාරකාර අරමුදල සඳහා සේව්‍යයා විසින් 03% ක දායකත්වයක් ලබාදේ.
- මාසිකව රු. 30,000/- ක කොන්ත්‍රාත් දීමනාවක් සහ අතිකාල දීමනා, දිරි දීමනා ගෙවනු ලැබේ.
- බඳවා ගැනීමෙන් පසුව කාර්ය චක්‍ර පදනම මත සේවයේ යෙදවේ.
- බඳවා ගැනීම - සම්මුඛ පරීක්ෂණයකින් පසුව පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රතිඵල මත මණ්ඩලීය පිළිවෙත් අනුව සිදු කෙරේ.
- බඳවා ගැනීම ප්‍රාදේශික මට්ටමින් සිදුකරනු ලබන අතර, එක් අයදුම්කරුවෙක් තමන් කැමති ප්‍රාදේශිකයන් තුන (03) ක් සඳහා ඉල්ලුම් කළ යුතු අතර, පත් කිරීමෙන් පසු සේවා ස්ථාන වෙනස් කිරීම් සිදු නොකෙරේ.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරනලද අයදුම්පතක් "ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2023.09.30 දිනට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. ලිපිය බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි තමන් අයදුම්කරන තනතුර හා පලාත සඳහන් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී පාසල් හැරයාමේ සහතිකය (ශිෂ්‍ය කාර්ය දර්ශනය) අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ. ආකෘති පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,**
**අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**

---

### අයදුම්කරන තනතුර ............................

01. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........
(ආ) මුලකුරු සමග නම : ..........

02. ලිපිනය : ..........

03. i. උපන් දිනය : ..........
ii. 2023.09.30 දිනට වයස : අවුරුදු ......... මාස ...... දින .........

04. ජාතික හැඳුනුම්පත් අංකය : ..........

05. ආගම : ..........

06. ජාතිය : ..........

07. i. ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද යන වග : ..........
ii. එසේ නම් ලියාපදිංචියෙන්ද පරම්පරාවෙන්ද යන වග : ........

08. පලාත : .................... දිස්ත්‍රික්කය : ....................
ආසන්නතම ශ්‍රී ලංගම බස් ඩිපෝව :

08.1 අයදුම් කරනු ලබන ප්‍රාදේශික (ප්‍රමුඛතාවය අනුව)
1.
2.
3.

09. අධ්‍යාපන සුදුසුකම්
i. අ.පො.ස. (සා/පෙළ)
වර්ෂය , ..........
විභාග අංකය : ..........

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

අ.පො.ස. (උ/පෙළ)
වර්ෂය ..........
විභාග අංකය : ..........

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

10. බර (කිලෝ) : ..........

11. උස අඩි .................... අඟල් : ..........

12. දුරකථන අංකය නිවස : ..........

13. i. රියදුරු බලපත්‍ර අංකය (අදාළවේ නම් පමණි) : ..........
ii. බලපත්‍ර කාණ්ඩය : ..........
iii. වලංගු කාලය : ..........

14. i. කොන්දොස්තර බලපත්‍ර අංකය (අදාළවේ නම් පමණි) :
..........
ii. නිකුත් කළ ආයතනය :

15. i. මීට ඉහත දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කර ඇත්ද :
..........
ii. එසේනම් ඒ පිළිබඳ තොරතුරු සවිස්තරව සඳහන් කරන්න
..........

16. i. මීට ඉහතදී උසාවියකින් ඔබ වරදකරු වී තිබේද ?
..........
ii. එසේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න
..........

ඉහත සඳහන් විස්තර මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික වන අතර අසත්‍ය තොරතුරක් සැපයුවහොත් ඒ සම්බන්ධව මණ්ඩලය ගනුලබන ඕනෑම තීරණයකට එකග වන බවද සහතික වෙමි.

දිනය : .................... ....................
අයදුම්කරුගේ අත්සන